# ලාංකේය වංශකතා සාහිත්‍යය තුළ ධර්ම සංඝායනා විස්තර ඇතුළත් කිරීමේ සාහිත්‍යමය හා ශාසනික වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

**රිල්හේනේ සුධීර හිමි[1]**

ප්‍රමුඛ පදඃ වංශකථා, සංගායනා, බෞද්ධ, ශාසනික, අධ්‍යයනය, ලිඛිත

## හැඳින්වීම

ධර්ම සංගායනා වූ කලී ශාසන ඉතිහාසය අධ්‍යනයෙහිලා ප්‍රකට සන්දර්භයක් ලෙස දැක්විය හැකිය. බුදුරජාණන් වහන්සේ ධරමාන අවධියේදී ම ධර්ම සංගායනාවක ඇති වැදගත්කම සිය දේශනාවන් තුළ අවධාරණය කර ඇති අයුරු දීඝ නිකායාගත පාසාදිකා සූත්‍රයෙන් ප්‍රකට වේ. එහෙත් ධර්ම විනය රැකීමේ සෘජු අරමුණ ප්‍රමුඛ කර ගනිමින් ධර්ම සංගායනා පැවැත් වූ බවට පෙළ දහම තුළ සාක්ෂි නොමැත. ඒ අනුව ධර්ම සංගායනා පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ථෙරවාද සහ මහායාන සංගායනා ලෙස මෙකී අවස්ථාවන් ප්‍රභේද කොට දැක්විය හැකිය. ධර්ම සංගායනාවක් යනු තෝරාගත් පිරිසක් විසින් සාමූහික සාකච්ඡාවක් හෝ සජ්ඣායනාවක් සිදු කොට අරමුණු කරන කරුණු විෂයෙහි ඇති නිරවද්‍යභාවය සනාථ කිරීම සරල ලෙස පෙන්වාදිය හැකිය. එකී ථෙරවාද ධර්ම සංගායනාවන් පිළිබඳ කරුණු අන්තර්ගත මූලාශ්‍රයන් දැක්වීමේ දී ථෙරවාද පාළි ත්‍රිපිටකයේ විනය පිටකාගත චුල්ලවග්ගපාළියෙහි එන පඤ්චසතිකක්ඛන්ධකය හා සත්සතිකක්ඛන්ධකය ප්‍රමුඛව වනු ඇත. ඉන් පිටත ලාංකීය බොහෝමයක් වංශකතා සාහිත්‍යන් තුළ ආරම්භක පරිච්ඡේදයන් ධර්ම සංගායනා විස්තර සඳහා වෙන් කොට ඇති ආකාරය දැකගත හැකිය. ලක්දිව ඉතිහාසගත තොරතුරු ඉදිරිපත් කිරීමේ දී වංශකථා සාහිත්‍යය සම්ප්‍රදාය තුළ භාරතීය බෞද්ධ ධර්ම සංගායනා විස්තර ඇතුළත් කිරීම ද එයටම අනන්‍යය වූ ලක්ෂණයක් වී ඇති බව ඒවා අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. ඒ අනුව තෝරාගත් වංශකථා සාහිත්‍යයන් කිහිපයක් ගුරුකොට ගනිමින් මෙම පර්යේෂණ ලිපිය තුළ ශ්‍රී ලාංකීය වංශකථා සාහිත්‍යය තුළ ධර්ම සංගායනා විස්තර ඇතුළත් කිරීමේ සාහිත්‍යමය හා ශාසනික වැදගත්කම පිළිබඳ ප්‍රමුඛව සාකච්ඡා කරනු ලබයි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ ලාංකීය වංශකථා සාහිත්‍යය තුළට ධර්ම සංගායනා තොරතුරු ඇතුළත් කිරීමෙන් බෞද්ධ ශාසනයටත් හා සිංහල සාහිත්‍යයටත් ඇති වූ වැදගත්කම කුමක්ද යන්නයි. පර්යේෂණ අරමුණ වන්නේ වංශකථා සාහිත්‍යය තුළ දක්නට ලැබෙන ධර්ම සංගායනා පිළිබඳ විස්තර විශ්ලේෂණය කිරීම හා එමගින් ප්‍රකටවන ශාසනික වැදගත්කම විමසා බැලීමයි. තවද ඒ තුළින් පෙනී යන සාහිත්‍යය වටිනාකම සහ කරුණු ඇතුළත් කිරීමේ විෂමතාවය විමර්ශනය කිරීම මෙහි අරමුණු වශයෙන් පෙන්වාදිය හැකිය.

[1] බෞද්ධ අධ්‍යන පීඨය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය
rilhenesudheera@gmail.com

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරනු ලබන අතර භාවිතා කරනු ලබන ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මහාවංශය, දීපවංශය, ථූපවංශය, හා බෝධිවංශය පෙන්වාදිය හැකිය. ද්විතියික මූලාශ්‍රය ලෙස බෞද්ධ සාහිත්‍යය හා ශාසන ඉතිහාසය පිලිබඳ විමර්ශන කෘති විද්‍යාත්මක ලිපි හා සංග්‍රහයන් අදාළ කරගන්නා ලදි. දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ ප්‍රස්තුතයට අනුකූලව නිරීක්ෂණ හා සමානතා හා විෂමතා පිළිබඳව ද විග්‍රහ කරනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වංශකතා සාහිත්‍යය තුළින් ලාංකීය ඉතිහාසය පමණක් නොව ධර්ම සංගායනා වැනි පෘථුල අංශයන් පිළිබඳ ඉදිරිපත් කිරීම තුළින් නූතන පරිශීලකයන්ට ද බෞද්ධ ඉතිහාසය පිළිබඳ අභිප්‍රේරණයක් ඇති කිරීම සහ ධර්ම සංගායනා වනාහි පූජනීය ක්‍රියාවක් ලෙස පිළිගැනීමට උත්සුක වී ඇත ඒ තුළින් ලාංකීය ඉතිහාසය හැදෑරීමට ද මූලාරම්භයක් සපයා ගත හැකිය තවද ධර්ම සංගායනා තුළින් බුදු සසුනේ මූලික දහරාව ප්‍රකට කරනු ලබයි. එබැවින් සංඝ සාමග්‍රිය සහ විනය නීති රැකීමෙහි අවශ්‍යතාවය ද පෙන්වා දෙනු ලබයි. සමස්තයක් ලෙස ගත් කල භාරත දේශය තුළ සිදුවූ ධර්ම සංගායනාවන් පිළිබඳව ලාංකීය වංශකථා සාහිත්‍යයේ මුල් පරිච්ඡේදයන්ට වැඩි ඉඩ කඩක් ලබා දීම තුළින් බෞද්ධ පරිසරය පිළිබඳ පළමුව හැදෑරීමට ලාංකීය ජනතාවට අවකාශයක් ලබා දෙනු ඇත. එහෙත් මෙරට ජනතාවට වංශකථා පරිශීලනය කිරීමේ දී භාරතය වැනි රටක සිදු වූ මෙවැනි තොරතුරු ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය කුමක් ද යන්න පිළිබඳවත් උභතෝකෝටික පැනයන් ඉදිරිපත් විය හැකිය එහෙත් ලාංකීය ඉතිහාසගත රාජ්‍ය නාමාවලිය සහ ඔවුනොවුන්ගේ ආගමික හර පද්ධතීන් ඉගෙනීමේ දී බෞද්ධ ධර්ම සංගායනාව අත්නොහැරිය හැකි ආගමික විෂය පද්ධතියක් ලෙස මතු කළ හැකිය.

## නිගමනය

ලාංකීය වංශකථා සාහිත්‍යය බෞද්ධ ශාසන ඉතිහාසය ඉදිරිපත් කරන ලිඛිත මූලාශ්‍රයන් අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. එකී ග්‍රන්ථ තුළ පළමු, දෙවන, තුන්වන ධර්ම සංගායනාවන් පිළිබඳව තොරතුරු කතෘවරුන් විසින් ඉතා ගෞරවයෙන් හා ආගමික ස්වරූපයකින් නිරූපණය කර ඇත. මෙහි දී ඔවුන් භාවිතා කළ ගාථා, උපමා, රූපක, අනුප්‍රාසාත්මක පද ආදිය ද මෙම කරුණු ඉදිරිපත් කිරීමේ දී වටිනාකමක් එක් කිරීමට උපස්ථම්භක වී ඇති බව මෙමගින් නිගමනය වශයෙන් පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත මූලාශ්‍රය

***දීපවංශය.*** (2019) පොන්සේකා. ප්‍රසාද්, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

***මහාවංශය සිංහල.*** (2003). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

***සිංහල බෝධි වංශය***. (2022). මොරටුවගම. එච් එම්, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

***සිංහල ථූපවංශය.*** (1986). වනරත්න, රංජිත්. කොළඹ 10: සමයවර්ධන පබ්ලිෂර්ස්.